සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 12 - 2024

විභාග අංකයඃ ......................................

# රසායන විද්‍යාව - I

කාලය පැය 02 යි

උපදෙස්
- ආවර්තිතා වගුවක් සපයා ඇත.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 01 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (x) යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$ ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$

ප්ලැන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ J\ s$ ආලෝකයේ වේගය $= 3 \times 10^{8}\ m\ s^{-1}$

(01) ඉලෙක්ට්‍රෝනය පිළිබඳ පහත සොයා ගැනීම් සලකන්න.
- ඉලෙක්ට්‍රෝනයේ ආරෝපණය.
- පරමාණුවක න්‍යෂ්ටිය වටා චලනය වන ඉලෙක්ට්‍රෝනයකට තරංගයක් ලෙස හැසිරිය හැකි බව.

(1) ජේ.ජේ. තොම්සන්, ලුවී ඩී. බ්‍රෝග්ලි
(2) රොබට් මිලිකන්, මැක්ස් ප්ලාන්ක්
(3) ජේ.ජේ. තොම්සන්, මැක්ස් ප්ලාන්ක්
(4) අර්නස්ට් රදර්ෆඩ්, ඇල්බර්ට් අයින්ස්ටයින්
(5) රොබට් මිලිකන්, ලුවී ඩී. බ්‍රෝග්ලි

(02) $n = 3$, $l = 1$, $m_l = 0$, $m_s = +½$ යන ක්වොන්ටම් අංක කුලකයේ නිරූපණය වන්නේ පහත කුමන ඉලෙක්ට්‍රෝනය ද?

(1) 3p (2) 2p (3) 3d (4) 3s (5) 2p

(03) හයිඩ්‍රජන් පරමාණුවේ පහත කවර ශක්ති මට්ටම් 2 ක් අතර සිදුවන ඉලෙක්ට්‍රෝන සංක්‍රමණයකදී අඩුම තරංග ආයාමයක් ඇති විද්‍යුත් චුම්භක විකිරණයක් මුදා හරිද?

(1) $n = 2 \rightarrow n = 4$ (2) $n = 7 \rightarrow n = 3$ (3) $n = 8 \rightarrow n = 5$
(4) $n = 2 \rightarrow n = 1$ (5) $n = 1 \rightarrow n = 2$

(04) යටින් ඉරි ඇඳි මූලද්‍රව්‍යයේ ඔක්සිකරණ අංකය වැඩිවන පිළිවෙලට සකස් කර ඇත්තේ,

(1) $\underline{C}lO^{-}_4$, $\underline{C}lO_3$, $\underline{C}lO_2$ (2) $\underline{M}nO^{-}_4$, $\underline{M}nO_2$, $\underline{M}n^{2+}$
(3) $\underline{C}r_2O_7^{2-}$, $[\underline{C}r(H_2O)_6]Cl_2$, $CrCl_3$ (4) $Na_2\underline{S}$, $\underline{S}Cl_2$, $\underline{S}O_4^{2-}$
(5) $\underline{N}_2O_3$, $\underline{N}O_3^{-}$, $\underline{N}O_2$

(05) සංයෝගයක් තුළ ස්කන්ධය අනුව කාබන් 72% ක් හයිඩ්‍රජන් 12% ක් ද, ඔක්සිජන් 16% ක් ද ඇත. මෙම සංයෝගයේ ආනුභවික සූත්‍රයේ පවතින C : H අතර අනුපාතය,

(1) 1 : 1 (2) 1 : 2 (3) 1 : 6 (4) 6 : 1 (5) 2 : 1

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(06) $NO_2^-$ , $NO_2$ , $NO_2^+$ යන ප්‍රභේද වල O - N - O බන්ධන කෝණය වැඩිවන පිළිවෙලට සකසා ඇත්තේ,

(1) $NO_2 < NO_2^- < NO_2^+$ (2) $NO_2^+ < NO_2 < NO_2^-$ (3) $NO_2^- < NO_2 < NO_2^+$

(4) $NO_2^+ < NO_2^- < NO_2$ (5) $NO_2^- < NO_2^+ < NO_2$

(07) $[Fe(SCN)(H_2O)_5]Cl_2$ හි මධ්‍ය ලෝහ අයනයේ ඔක්සිකරණ අංකය හා සංගත අංකය වන්නේ,

(1) +3 , 2 (2) +3 , 5 (3) +2 , 6 (4) +2 , 2 (5) +3 , 6

(08) Ne (නියොන්) වායුවේ ඝනත්වය වැඩිම වන්නේ,

| | උෂ්ණත්වය | පීඩනය (Pa) |
|---|---|---|
| (1) | $0\ ^0C$ | $1 \times 10^5$ |
| (2) | $0\ ^0C$ | $2 \times 10^5$ |
| (3) | $273\ ^0C$ | $1 \times 10^5$ |
| (4) | $273\ ^0C$ | $2 \times 10^5$ |
| (5) | 298 K | $1 \times 10^5$ |

(09) පහත දත්ත ඇසුරින් C (s, graphite) $\rightarrow$ C (s, diamond) යන ප්‍රතික්‍රියාවේ සම්මත ප්‍රතික්‍රියා එන්තැල්පිය ($\Delta H^o_{rxn}$) සොයන්න.

| මූල ද්‍රව්‍යය | සම්මත දහන එන්තැල්පිය / $kJ\ mol^{-1}$ |
|---|---|
| C (s, graphite) | - 393 |
| C (s, diamond) | - 395 |

(1) -2 (2) +788 (3) -788 (4) +2 (5) 0

(10) X නැමැති අවර්ණ සංයෝගය තදින් රත් කළ විට වර්ණවත් වායුවක් ලබාදේ. X පහන් සිළු පරීක්ෂාවේ දී කහ පැහැති කොළ දැල්ලක් ලබා දේ. X විය හැක්කේ,

(1) $Ba(NO_3)_2$ (2) $Cu(NO_3)_2$ (3) $Ba(NO_2)_2$ (4) $Mg(NO_3)_2$ (5) $CuBr_2$

(11) පහත සඳහන් අණු අතරින් නිර්ධ්‍රැවීය අණුවක් වන්නේ,

(1) $CHCl_3$ (2) CO (3) $SF_6$ (4) $SF_4$ (5) $H_2O$

(12) Ba (බේරියම්) හා එහි සංයෝග සම්බන්ධ අසත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) Ba ලෝහය වාතයේ දහනය කර ලැබෙන ශේෂයට ජලය එක් කළ විට පැහැදිලි ද්‍රාවණයක් ලැබේ.

(2) Ba අඩංගු කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩ අතරින් වැඩිම භාස්මිකතාවයක් දක්වන්නේ $Ba(OH)_2$ වේ.

(3) Ba , අඩංගු කාණ්ඩයේ කාබනේට අතරින් වැඩිම තාප ස්ථායි සංයෝගය වන්නේ $BaCO_3$ වේ.

(4) Ba , වැඩිපුර $O_2$ තුල දහනය කළ විට සුපර් ඔක්සයිඩයක් ලැබේ.

(5) Ba අඩංගු කාණ්ඩයේ මූලද්‍රව්‍ය අතරින් වැඩිම සීඝ්‍රතාවයකින් ජලය සමඟ ප්‍රතික්‍රියා වන්නේ Ba වේ.

(13)
```
                        CH2-CH3
                        |
CH3 - CH2 - C = CH - C - CH2OH
            |        |
            CH3      H
```
හි IUPAC නාමය වන්නේ,

(1) 2 - ethyl - 4 - methylhex - 3 - en - 1 - 01 (2) 5 - ethyl - 4 - methylhex - 3 - en - 1- 01

(3) 3 - methy - 5 - ethlhex - 3 - en - 6 - 01 (4) 2 - ethyl - 4 - methylhex - 3 - ene - 1 -01

(5) 4 - ethyl - 3 - methylhex - 3 - ene - 6 - 01

(14) වායුමය හයිඩ්‍රොකාබනයක හයිඩ්‍රජන් 14% පමණ ඇත. ස.උ.පී. හි දී එම වායුවේ 0.042 g ක පරිමාව $13.44\ cm^3$ විය. හයිඩ්‍රොකාබනයේ අණුක සූත්‍රය,

(1) $C_5H_{12}$ (2) $C_5H_{10}$ (3) $C_4H_8$ (4) $C_4H_{10}$ (5) $C_5H_8$

(15) විද්‍යුත් චුම්භක විකිරණයක ෆෝටෝන මවුලයක අඩංගු ශක්තිය $203\ kJ\ mol^{-1}$ වේ. මෙම කිරණයේ තරංග ආයාමය වන්නේ, (nm)

(1) 459 (2) 589 (3) 671 (4) 781 (5) 856

(16) පහත දක්වා ඇත්තේ සංයෝග 3 ක් පිළිබඳ තොරතුරු වේ. එම තොරතුරු වලට වඩාත්ම ගැලපෙන සංයෝග කාණ්ඩය වන්නේ,

A - උභය ගුණි ඔක්සයිඩයකි.

B - ඉලෙක්ට්‍රෝන ඌන සංයෝගයකි.

C - ප්‍රබල ඔක්සිකාරකයකි.

(1) $Al_2O_3, BeCl_2, K_2C_2O_4$ (2) $BeO, AlCl_3, KMnO_4$ (3) $K_2O, AlCl_3, K_2Cr_2O_7$
(4) $ZnO, BeCl_2, K_2C_2O_4$ (5) $MgO, AlCl_3, KMnO_4$

(17) මෙතේන් $(CH_4)$ ක්ලෝරීනීකරණය වීමේදී දාම ප්‍රචාරණ පියවරක් වන්නේ,

(1) $Cl_2 \rightarrow 2\dot{C}l$ (2) $\dot{C}H_3 + \dot{C}H_3 \rightarrow C_2H_6$ (3) $\dot{C}H_3 + \dot{C}l \rightarrow CH_3Cl$
(4) $\dot{C}HCl_2 + \dot{H} \rightarrow CH_2Cl_2$ (5) $\dot{C}H_2Cl + Cl-Cl \rightarrow CH_2Cl_2 + \dot{C}l$

(18) $NH_3$ වායුව හා ඇමෝනියම් ලවණ පිළිබඳ අසත්‍ය වගන්තිය වන්නේ,

(1) ඇමෝනියා වායුව පහසුවෙන් ජලයේ දියවී දුබල ලෙස භාස්මික ද්‍රාවණයක් සාදයි.

(2) ඇමෝනියම් ලවණ, $Ba(OH)_2$ සමග ප්‍රතික්‍රියාවෙන් $NH_3(g)$ නිදහස් කරයි.

(3) ඇමෝනියම් ලවණ සියල්ල පහසුවෙන් තාපය හමුවේ වියෝජනය වී $NH_3$ වායුව නිදහස් කරයි.

(4) වියලි තත්වයේදී ලෝහ සමඟ ඇමෝනියා ඔක්සිකාරකයක් ලෙස ක්‍රියාකරයි.

(5) ඇමෝනියා වායුව හා වැඩිපුර $Cl_2$ වායුව අතර ප්‍රතික්‍රියාවෙන් ජලයේ විෂබීජ නාශකයක් නිපදවයි.

(19) පොටෑසියම් සුපර් ඔක්සයිඩ $(KO_2)$ හා $CO_2(g)$ අතර ප්‍රතික්‍රියාව පහත පරිදි වේ.

$$4KO_2(s) + 2CO_2(g) \rightarrow 2K_2CO_3(s) + 3O_2(g)$$

$KO_2(s)$ 2.84 g හා $CO_2(g)$ 1.76 g ක් ප්‍රතික්‍රියා කරවන ලද ප්‍රතික්‍රියාවේ සීමාකාරී ප්‍රතික්‍රියකය හා සෑදෙන $O_2$ ස්කන්ධය පිළිවෙලින්, $(K = 39, C = 12, O = 16)$

(1) $KO_2$ හා 0.48 g (2) $KO_2$ හා 4.8 g (3) $CO_2$ හා 0.24 g
(4) $CO_2$ හා 0.96 g (5) $KO_2$ හා 0.96 g

(20) 300 K උෂ්ණත්වයක පවතින He වායුවේ වර්ග මධ්‍යන්‍ය මූලවේගය සහිත $O_2$ වායුව පවතින උෂ්ණත්වය වන්නේ,

(1) 1200 K (2) 2400 K (3) 12000 K (4) 2400 °C (5) 1000 K

(21) 18 වන කාණ්ඩයේ මූලද්‍රව්‍ය හා Xe සාදන සංයෝග පිළිබඳ අසත්‍ය වන්නේ,

(1) Xe වල තාපාංකය He වලට වඩා වැඩිය.

(2) $XeO_3$ අණුව තලීය ත්‍රිකෝණාකාර හැඩයක් ගන්නා අතර Xe හි ඔක්සිකරණ අංකය +6 වේ.

(3) $XeF_2$ අණුව නිර්ධ්‍රැවීය වේ.

(4) සියළුම මූලද්‍රව්‍යයන්ට ධන ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ එන්තැල්පි අගයන් ඇත.

(5) කාණ්ඩයේ පහලට යන විට අයනීකරණ ශක්තිය අඩු වන බැවින් Xe, $F_2$ සමඟ ප්‍රතික්‍රියා කරයි.

(22) $H_2O(g)$ හි සම්මත උත්පාදන එන්තැල්පිය -242 $kJ\ mol^{-1}$ වේ. $H_2(g)$ හා $O_2(g)$ සම්මත බන්ධන විඝටන එන්තැල්පි අගයන් පිළිවෙලින් +436 $kJ\ mol^{-1}$ හා +496 $kJ\ mol^{-1}$ වේ. $H_2O(g)$ හි O - H බන්ධනයේ මධ්‍යන්‍ය බන්ධන විඝටන එන්තැපිය වන්නේ, ($kJ\ mol^{-1}$)

(1) +587 (2) +463 (3) -463 (4) +926 (5) -926

(23) කළු පැහැති අවක්ෂේපයක් හෝ සංයෝගයක් ලබා නොදෙන්නේ පහත කුමන අවස්ථාවේ දී ද?

(1) ලෙඩ් ඇසිටේට් $Pb(CH_3COO)_2$ ද්‍රාවණයක් හරහා $H_2S$ වායුව යැවීම.

(2) $Na_2S_2O_3$ ද්‍රාවණයකට $Pb(NO_3)_2$ ද්‍රාවණයක් එකතු කර රත්කිරීම.

(3) සාන්ද්‍ර $H_2SO_4$ හා සුක්‍රෝස් අතර ප්‍රතික්‍රියාව.

(4) $K_2SO_3$ ද්‍රාවණයකට $BaCl_2$ ද්‍රාවණයක් එකතු කිරීම.

(5) ආම්ලික මාධ්‍යයේ දී $Cu^{2+}$ ජලීය ද්‍රාවණයක් හරහා $H_2S$ වායුව යැවීම.

(24) $H_2O_2(aq)$ ද්‍රාවණයකින් 50 $cm^3$ ක් තනුක $H_2SO_4$ මගින් ආම්ලික කර වැඩිපුර KI ද්‍රාවණයක් සමඟ ප්‍රතික්‍රියා කරවන ලදී. එවිට නිදහස් වන $I_2$ සමඟ මුළුමනින්ම ප්‍රතික්‍රියා වීමට 0.01 $moldm^{-3}$ සාන්ද්‍රණය වන $Na_2S_2O_3$ ද්‍රාවණයකින් 20 $cm^3$ ක් වැය විය. $H_2O_2$ ද්‍රාවණයේ සාන්ද්‍රණය ($mol\ dm^{-3}$)

(1) 0.02 (2) 0.068 (3) 0.2 (4) 0.002 (5) 0.032

(25) 298 K උෂ්ණත්වයක සංවෘත බඳුනක් තුල ඇති $CH_4(g)$ හා $O_2(g)$ වායුව සමාන ස්කන්ධ ඇත. බඳුන තුල ඇති $O_2(g)$ හි ආංශික පීඩනය ($P_{O_2}$) හා බඳුන තුළ මුළු පීඩනය ($P_T$) අතර අනුපාතය වන්නේ,

(1) 1 : 2 (2) 1 : 3 (3) 2 : 3 (4) 3 : 1 (5) 1 : 5

(26) $2SO_2(g) + O_2(g) \rightarrow 2SO_3(g);\ \Delta H^\theta = -198\ kJ\ mol^{-1}$ යන ප්‍රතික්‍රියාව සම්බන්ධ සත්‍ය වන්නේ,

(1) $SO_2$ 2 mol ක් උත්පාදනය වීමේදී 396 kJ ක තාපයක් පරිසරයට නිදහස් කරයි.

(2) මෙම ප්‍රතික්‍රියාව පහළ උෂ්ණත්ව වලදී ස්වයං සිද්ධ වේ.

(3) මෙම ප්‍රතික්‍රියාවේ එන්ට්‍රෝපි වෙනස ධන අගයක් ගනී.

(4) $SO_2(g)$ මවුල එකක් සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියාවීමේදී 99 kJ ශක්තියක් පරිසරයෙන් අවශෝෂණය කරගනී.

(5) මෙම ප්‍රතික්‍රියාව සියලුම උෂ්ණත්ව වලදී ස්වයංසිද්ධ වේ.

(27) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) $NF_3$ හි බන්ධන කෝණය $NH_3$ වල බන්ධන කෝණයට වඩා විශාල වේ.

(2) මිනිරන් වල ඝනත්වය දියමන්ති වල ඝනත්වයට වඩා වැඩිය.

(3) $H_2O_2$ යනු ඒක තලීය අණුවකි.

(4) CO හි C හා O අතර බන්ධනය ත්‍රිත්ව බන්ධන ස්වරූපයක් ගනී.

(5) වායුමය අවස්ථාවේදී $AlCl_3$ ද්වි අවයවක සාදන අතර එහි Al හි මුහුම්කරණය $sp^2$ වේ.

(28) X නැමැති අකාබනික සංයෝගයක් වැඩිපුර NaOH සමඟ රත් කළ විට කටුක ගඳක් ඇති වායුවක් පිට විය. වායුව පිටවීම අවසන් වන තෙක් රත් කර එම මිශ්‍රණයට Al කුඩු කර එකතු කර නැවත රත් කළ විට ඉහත වායුවම නැවත පිට විය. X සංයෝගය විය හැක්කේ,

(1) $NH_4NO_3$ (2) $(NH_4)_2CO_3$ (3) $NaNO_3$ (4) $(NH_4)_2SO_4$ (5) $Na_2SO_3$

(29) $Fe^{3+}(aq)$ ද්‍රාවණයක් පහත දැක්වෙන ප්‍රතික්‍රියා වලට භාජනය කරන ලදී.




A, B හා C ප්‍රභේද වල වර්ණ වන්නේ පිළිවෙලින්,

(1) රතු දුඹුරු, රතු, කොළ (2) රතු දුඹුරු, රතු, කහ (3) කොළ, රතු, කහ
(4) කොළ, රතු, නිල් (5) රතු දුඹුරු, නිල්, කහ

(30) බ්‍රෝමීන් ($Br_2(l)$) හි සම්මත පරමාණුකරණ එන්තැල්පිය නිරූපණය වන තාප රසායනික සමීකරණය වන්නේ,

(1) $\frac{1}{2}Br_2(g) \rightarrow Br(g)$ (2) $Br_2(l) \rightarrow Br_2(g)$ (3) $\frac{1}{2}Br_2(l) \rightarrow Br(g)$
(4) $Br_2(l) \rightarrow 2Br(g)$ (5) $\frac{1}{2}Br_2(l) \rightarrow \frac{1}{2}Br(g)$

අංක 31 සිට 40 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේදැයි තෝරා ගන්න.

(a) සහ (b) පමණක් නිවැරදි නම් (1) මතද,
(b) සහ (c) පමණක් නිවැරදි නම් (2) මතද,
(c) සහ (d) පමණක් නිවැරදි නම් (3) මතද,
(d) සහ (a) පමණක් නිවැරදි නම් (4) මතද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මතද,
උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

(31) එකම මුහුම්කරණ අවස්ථාවේ පවතින කාබන් (C) පරමාණු අඩංගු වන්නේ කුමන කාණ්ඩයේ / කාණ්ඩ වලද?

(a) $H_2CO$, $C_2H_2$ (b) HCN, $CO_2$ (c) $CH_4$, $C_2H_4$ (d) $C_2H_6$, $H_2CO$

(32) විත්ති ගුණයක් වන්නේ,

(a) ස්කන්ධය (b) උෂ්ණත්වය (c) වර්තනාංකය (d) තාප ධාරිතාවය

(33) ජලය සමඟ ප්‍රතික්‍රියා වීමෙන් ඵල ලෙස අම්ල 2 ක් ලබා දෙන්නේ,

(a) $N_2O_3$ (b) $PCl_5$ (වැඩිපුර ජලය) (c) $NO_2$ (d) $SCl_2$

(34) පහත සංයෝග අතරින් ත්‍රිමාණ සමාවයවිකතාව දක්වන්නේ,

(a) 


(b) 


(c) 


(d) 

(35) හයිඩ්‍රජන් හේලයිඩ සම්බන්ධ <u>සත්‍ය</u> වගන්තිය / වගන්ති වන්නේ,

(a) 17 වන කාණ්ඩයේ පහළට හයිඩ්‍රජන් හේලයිඩ වල බන්ධන දිග වැඩිවේ.

(b) හයිඩ්‍රජන් හේලයිඩවල තාපාංකය 17 වන කාණ්ඩයේ පහළට ක්‍රමයෙන් අඩුවේ.

(c) 17 වන කාණ්ඩයේ පහළට යන විට හයිඩ්‍රජන් හේලයිඩවල ආම්ලික ප්‍රබලතාවය වැඩිවේ.

(d) හයිඩ්‍රජන් හේලයිඩ එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීමට $AgNO_3(aq)$ හා $NH_3(aq)$ භාවිතා කළ හැක.

(36) සැම විටම සෘණ (-) අගයන් වන එන්තැල්පි විපර්යාසය / විපර්යාස වන්නේ,

(a) පරමාණුකරණ එන්තැල්පිය

(b) දහන එන්තැල්පිය

(c) වාෂ්පීකරණ එන්තැල්පිය

(d) සජලන එන්තැල්පිය

(37) $CH_3CH=CH_2$ හා HBr අතර ප්‍රතික්‍රියාවෙන් පහත දැක්වෙන පරිදි ඵලයක් සෑදේ.

$CH_3CH_2CH_2Br$ (I)

$CH_3CH(Br)CH_3$ (II)

පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(a) මාකොනිකොෆ් නීතියට අනුව ප්‍රධාන ඵලය I වේ.

(b) II ප්‍රධාන ඵලය වේ.

(c) වඩා ස්ථායි අතරමැදි කාබො කැටායනයක් සෑදෙන්නේ II වන ඵලය සෑදෙන අවස්ථාවේදීය.

(d) I හා II යන ඵල 2 කට සමාන ප්‍රමාණ වලින් සෑදේ.

(38) ආන්තරික ලෝහ සම්බන්ධයෙන් <u>අසත්‍ය</u> වන්නේ,

(a) $H_2SO_4$ අම්ල නිෂ්පාදන ක්‍රියාවලියේ දී $V_2O_5$ උත්ප්‍රේරකයක් ලෙස භාවිතා කරයි.

(b) ජලීය $Zn^{2+}(aq)$ හා $Sc^{3+}(aq)$ අයන අවර්ණ වේ.

(c) සංගත සංකීර්ණ අයන සෑදීමේ හැකියාව ඇත්තේ ආන්තරික මූලද්‍රව්‍ය වලට පමණි.

(d) ආන්තරික ලෝහ අයන සාදන සියළුම සංගත සංකීර්ණ වර්ණවත් වේ.

(39) ජලීය $Na_2CO_3$ ද්‍රාවණයක $Na^+(aq)$ අයන සංයුතිය 46 ppm වේ. මේ ද්‍රාවණයේ ඝනත්වය $1\ g\ cm^{-3}$ නම්,

(a) $Na^+(aq)$ සාන්ද්‍රණය $1 \times 10^{-4}\ mol dm^{-3}$ වේ.

(b) $CO_3^{2-}(aq)$ සාන්ද්‍රණය $1 \times 10^{-3}\ mol dm^{-3}$ වේ.

(c) $CO_3^{2-}(aq)$ සාන්ද්‍රණය 96 ppm වේ.

(d) $Na_2CO_3$ සාන්ද්‍රණය $1 \times 10^{-4}\ mol dm^{-3}$ වේ.

(40) පහත කවර ජලීය ද්‍රාවණ යුගලයක් මිශ්‍ර කළ විට වර්ණවත් අවක්ෂේප / අවක්ෂේපයක් ලැබේ ද?

(a) $Na_2CO_3$ හා $H_2SO_4$

(b) NaI හා $AgNO_3$

(c) $BaCl_2$ හා $K_2CrO_4$

(d) $CaCl_2$ හා $K_2C_2O_4$

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- අංක 41 - 50 තෙක් වූ ප්‍රශ්න සඳහා පහත උපදෙස් පිළිපදින්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 01 | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |
| 02 | සත්‍යය | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදේ |
| 03 | සත්‍යය | අසත්‍යය |
| 04 | අසත්‍යය | සත්‍යය |
| 05 | අසත්‍යය | අසත්‍යය |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| (41) $KMnO_4$ ද්‍රාවණයක සාන්ද්‍රණය නිර්ණය කිරීමට ආම්ලිකෘත $K_2C_2O_4$ භාවිතා කළ හැක. | $K_2C_2O_4$ යනු ප්‍රාථමික සම්මතයකි. |
| (42) $H_2O_2$ වල තාපාංකය $H_2O$ තාපාංකයට වඩා වැඩිය. | $H_2O$ අණු මෙන්ම $H_2O_2$ අණු අතර ද H - බන්ධන පවතී. |
| (43) pentane ($C_5H_{12}$) හි තාපාංකය 2-methylbutane එල තාපාංකයට වඩා වැඩිය. | pentane හා 2-methylbutane යනු දාම සමාවයවික වේ. |
| (44) දියමන්ති යනු විද්‍යුතය සන්නයන නොකරන කාබන්වල බහුරූපී ආකාරයකි. | දියමන්ති වල ඇති C හි මුහුම්කරණ $sp^2$ වේ. |
| (45) හයිඩ්‍රජන් පරමාණුක වර්ණාවලිය රේඛා වර්ණාවලියකි. | වර්ණාවලියේ එක් එක් රේඛාව H - පරමාණුවේ එක් එක් ශක්ති මට්ටමකට අනුරූප වේ. |
| (46) $BF_3$ හා $NH_3$ අණුවල හැඩය තලීය ත්‍රිකෝණාකාර වේ. | $BF_3$ හා $NH_3$ යන අණු 2 කම විෂම පරමාණුක අණු වේ. |
| (47) $HCO_3^-$ අයනයේ සියළුම C - O බන්ධන දිග සමානය. | $HCO_3^-$ සඳහා ස්ථායි සම්ප්‍රයුක්ත ව්‍යුහ 3 ක් ඇත. |
| (48) ක්ලෝරීන් (Cl) හි ඔක්සි අම්ලවල ආම්ලිකතාවය $HOCl < HClO_2 < HClO_3 < HClO_4$ ලෙස වෙනස් වේ. | ක්ලෝරීන් වල ඔක්සිකරණ අංකය වැඩි වන විට ආම්ලික ප්‍රභලතාවය වැඩිවේ. |
| (49) $H_2S$ ඔක්සිහාරකයක් ලෙස පමණක් ක්‍රියා කරයි. | $H_2S$ හි S පරමාණුවේ ඔක්සිකරණ අංකය -2 වේ. |
| (50) දෘඩ බඳුනක් තුළ ඇති පරිපූර්ණ වායුවක පීඩනය, උෂ්ණත්වය වැඩි කළ විට අඩුවේ. | උෂ්ණත්වය වැඩි කළ විට අණු අතර දුර වැඩිවේ. |

## The Periodic Table / ආවර්තිතා වගුව

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1<br>H | | | | | | | | | | | | | | | | | 2<br>He |
| 2 | 3<br>Li | 4<br>Be | | | | | | | | | | | 5<br>B | 6<br>C | 7<br>N | 8<br>O | 9<br>F | 10<br>Ne |
| 3 | 11<br>Na | 12<br>Mg | | | | | | | | | | | 13<br>Al | 14<br>Si | 15<br>P | 16<br>S | 17<br>Cl | 18<br>Ar |
| 4 | 19<br>K | 20<br>Ca | 21<br>Sc | 22<br>Ti | 23<br>V | 24<br>Cr | 25<br>Mn | 26<br>Fe | 27<br>Co | 28<br>Ni | 29<br>Cu | 30<br>Zn | 31<br>Ga | 32<br>Ge | 33<br>As | 34<br>Se | 35<br>Br | 36<br>Kr |
| 5 | 37<br>Rb | 38<br>Sr | 39<br>Y | 40<br>Zr | 41<br>Nb | 42<br>Mo | 43<br>Tc | 44<br>Ru | 45<br>Rh | 46<br>Pd | 47<br>Ag | 48<br>Cd | 49<br>In | 50<br>Sn | 51<br>Sb | 52<br>Te | 53<br>I | 54<br>Xe |
| 6 | 55<br>Cs | 56<br>Ba | La-<br>Lu | 72<br>Hf | 73<br>Ta | 74<br>W | 75<br>Re | 76<br>Os | 77<br>Ir | 78<br>Pt | 79<br>Au | 80<br>Hg | 81<br>Tl | 82<br>Pb | 83<br>Bi | 84<br>Po | 85<br>At | 86<br>Rn |
| 7 | 87<br>Fr | 88<br>Ra | Ac-<br>Lr | 104<br>Rf | 105<br>Db | 106<br>Sg | 107<br>Bh | 108<br>Hs | 109<br>Mt | 110<br>Ds | 111<br>Rg | 112<br>Cn | 113<br>Nh | 114<br>Fl | 115<br>Mc | 116<br>Lv | 117<br>Ts | 118<br>Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57<br>La | 58<br>Ce | 59<br>Pr | 60<br>Nd | 61<br>Pm | 62<br>Sm | 63<br>Eu | 64<br>Gd | 65<br>Tb | 66<br>Dy | 67<br>Ho | 68<br>Er | 69<br>Tm | 70<br>Yb | 71<br>Lu |
| 89<br>Ac | 90<br>Th | 91<br>Pa | 92<br>U | 93<br>Np | 94<br>Pu | 95<br>Am | 96<br>Cm | 97<br>Bk | 98<br>Cf | 99<br>Es | 100<br>Fm | 101<br>Md | 102<br>No | 103<br>Lr |

12 ශ්‍රේණිය GRADE 12 රසායන විද්‍යාව CHEMISTRY

The Periodic Table / ආවර්තිතා වගුව

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1<br>H | | | | | | | | | | | | | | | | | 2<br>He |
| 2 | 3<br>Li | 4<br>Be | | | | | | | | | | | 5<br>B | 6<br>C | 7<br>N | 8<br>O | 9<br>F | 10<br>Ne |
| 3 | 11<br>Na | 12<br>Mg | | | | | | | | | | | 13<br>Al | 14<br>Si | 15<br>P | 16<br>S | 17<br>Cl | 18<br>Ar |
| 4 | 19<br>K | 20<br>Ca | 21<br>Sc | 22<br>Ti | 23<br>V | 24<br>Cr | 25<br>Mn | 26<br>Fe | 27<br>Co | 28<br>Ni | 29<br>Cu | 30<br>Zn | 31<br>Ga | 32<br>Ge | 33<br>As | 34<br>Se | 35<br>Br | 36<br>Kr |
| 5 | 37<br>Rb | 38<br>Sr | 39<br>Y | 40<br>Zr | 41<br>Nb | 42<br>Mo | 43<br>Tc | 44<br>Ru | 45<br>Rh | 46<br>Pd | 47<br>Ag | 48<br>Cd | 49<br>In | 50<br>Sn | 51<br>Sb | 52<br>Te | 53<br>I | 54<br>Xe |
| 6 | 55<br>Cs | 56<br>Ba | La-<br>Lu | 72<br>Hf | 73<br>Ta | 74<br>W | 75<br>Re | 76<br>Os | 77<br>Ir | 78<br>Pt | 79<br>Au | 80<br>Hg | 81<br>Tl | 82<br>Pb | 83<br>Bi | 84<br>Po | 85<br>At | 86<br>Rn |
| 7 | 87<br>Fr | 88<br>Ra | Ac-<br>Lr | 104<br>Rf | 105<br>Db | 106<br>Sg | 107<br>Bh | 108<br>Hs | 109<br>Mt | 110<br>Ds | 111<br>Rg | 112<br>Cn | 113<br>Nh | 114<br>Fl | 115<br>Mc | 116<br>Lv | 117<br>Ts | 118<br>Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57<br>La | 58<br>Ce | 59<br>Pr | 60<br>Nd | 61<br>Pm | 62<br>Sm | 63<br>Eu | 64<br>Gd | 65<br>Tb | 66<br>Dy | 67<br>Ho | 68<br>Er | 69<br>Tm | 70<br>Yb | 71<br>Lu |
| 89<br>Ac | 90<br>Th | 91<br>Pa | 92<br>U | 93<br>Np | 94<br>Pu | 95<br>Am | 96<br>Cm | 97<br>Bk | 98<br>Cf | 99<br>Es | 100<br>Fm | 101<br>Md | 102<br>No | 103<br>Lr |


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 12 - 2024**

විභාග අංකයː ......................................

# රසායන විද්‍යාව - II

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

- ආවර්තිතා වගුවක් 15 වැනි පිටුවෙහි සපයා ඇත.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
- ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකි ය.

උදාහරණය ː  කාණ්ඩය $CH_3CH_2$ - ලෙස දැක්විය හැකි ය.

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු 02 - 08)**

- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බවද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බවද සලකන්න.

**B කොටස සහ C කොටස - රචනා (පිටු 09 - 14)**

- එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
- සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් තුනට පිළිතුරු **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| | එකතුව | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ ː | |
| අධීක්ෂණය කළේ ː | |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## <u>ව්‍යුහගත රචනා</u>

### <u>(A කොටස)</u>

ප්‍රශ්න 4ටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

(01) (a) දී ඇති ඝන සංයෝග ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සැ.යු. එක් සංයෝගයක් එක් වරක් පමණක් භාවිතා කරන්න.

$KNO_2$, $PbS_2O_3$, $K_2CO_3$, $PbI_2$, $AlCl_3$, $Al_2O_3$

(i) තාප ස්ථායි සංයෝගයකි. ....................................

(ii) සිසිල් ජලයේ අද්‍රාව්‍ය වන නමුත් උණු ජලයේ ද්‍රාව්‍ය ඝන සංයෝගය ....................................

(iii) ජලය හමුවේ රත් කරන විට වර්ණ විපර්යාසයක් ලබා දෙන සංයෝගය ....................................

(iv) වායු අවස්ථාවේ දී ද්වීඅවයවක සාදන සංයෝගය ....................................

(v) සිසිල් ජලයේ අද්‍රාව්‍ය නමුත් තනුක HCl වලත් තනුක NaOH වලත් ද්‍රාව්‍ය සංයෝගය

....................................

(vi) තනුක HCl එකතු කරන විට වර්ණවත් වායුවක් පිටවන සංයෝගය ....................................

(1a. ලකුණු 4 x 6 = 24)

(b) (i) $(CN_3H_6)^+$ අයනය සඳහා වඩාත් පිළිගත හැකි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය අඳින්න.

(ii) ඉහත (i) හි අඳින ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහය සඳහා තවත් ලුවිස් තිත් - ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) 02 ක් අඳින්න.

(iii) පහත සඳහන් ලුවිස් තිත් - ඉරි ව්‍යුහය හා ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.



| | $^{1}C$ | $^{2}C$ | $^{3}C$ | $^{4}N$ | $^{5}O$ |
|---|---|---|---|---|---|
| (I) පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | | |
| (II) පරමාණුව වටා හැඩය | | | | | |
| (III) ඔක්සිකරණ අංකය | | | | | |

- කොටස් (iv) සහ (v) දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iii) කොටසෙහි ආකාරයටම වේ.

(iv) පහත දැක්වෙන පරමාණු දෙක අතර සිග්මා බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනා ගන්න.

| | | | |
|---|---|---|---|
| (I) | H - $^{1}C$ | H - ....................... | $^{1}C$ - ....................... |
| (II) | $^{1}C$ - $^{2}C$ | $^{1}C$ - ....................... | $^{2}C$ - ....................... |
| (III) | $^{2}C$ - $^{3}C$ | $^{2}C$ - ....................... | $^{3}C$ - ....................... |
| (IV) | $^{3}C$ - $^{4}N$ | $^{3}C$ - ....................... | $^{4}N$ - ....................... |
| (V) | $^{3}C$ - $^{5}O$ | $^{3}C$ - ....................... | $^{5}O$ - ....................... |

(v) පහත දැක්වෙන $^{1}C$, $^{2}C$, $^{3}C$, $^{5}O$, $^{4}N$ පරමාණු වල විද්‍යුත් සෘණතාවය ආරෝහණය වන පිළිවෙලට සකසන්න.

..........................................................................................................................

(1b. ලකුණු 52)

(c) වරහන් තුළ දක්වා ඇති ගුණය ආරෝහණය වන පිළිවෙළට සකසන්න.

(i) $Cl_2, Ar, Al, Si$ (ද්‍රවාංකය)

..........................................................................................................................

(ii) $CO, H_2CO, CH_3OH, HCO_3^-$ (C හි ඔ'කරණ අංකය)

..........................................................................................................................

(iii) $MgCl_2, MgBr_2, MgI_2, MgF_2$ (අයනික ස්වභාවය)

..........................................................................................................................

(vi) B, O, F, N (දෙවන අයනීකරණ ශක්තිය)

..........................................................................................................................

(1c. ලකුණු 24)

(02)(a) X යනු ආවර්තිතා වගුවේ පරමාණුක ක්‍රමාංකය 20 ට අඩු s ගොනුවේ මූලද්‍රව්‍යයකි. X හි පළමු අයනීකරණ ශක්තිය කාණ්ඩයේ ඉහලම අගය නොවේ. X වාතයේ දහනය කළ විට දීප්තිමත් සුදු දැල්ලක් සහිතව දහනය වී $X_1$ සුදු පැහැ අවශේෂයක් ලබා දෙයි. X සිසිල් ජලය සමඟ ප්‍රතික්‍රියා නොකරන අතර උණු ජලය සමඟ ප්‍රතික්‍රියා කර ජල අද්‍රාව්‍ය $X_2$ සුදු පැහැයට හුරු අවක්ෂේපයක් හා $X_3$ වායුව පිටකරයි. X, $N_2$ වායුව සමඟ රත්කළ විට $X_4$ නම් ස්ථායී සංයෝගයක් සාදයි. $X_4$ ජලය සමඟ ප්‍රතික්‍රියා කර $X_2$ හා කටුක ගන්ධයක් ඇති රතු ලිට්මස් නිල්පැහැ ගන්වන අවර්ණ $X_5$ වායුව පිටකරයි.

(i) X හා $X_1$ සිට $X_5$ විශේෂ හඳුනාගන්න.

X = ..............................   $X_3$ - ..............................

$X_1$ = ..............................   $X_4$ - ..............................

$X_2$ = ..............................   $X_5$ - ..............................

(ii) X හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

..........................................................................................................................

(iii) පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(I) X හා $N_2$ වායුව අතර - ..........................................................................................

(II) X හා උණු ජලය අතර -..........................................................................................

(III) $X_4$ හා ජලය අතර - ..........................................................................................

(iv) $X_5$ වායුව හඳුනා ගැනීම සඳහා සරල පරීක්ෂාවක් හා එහි නිරීක්ෂණය ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

(2a. ලකුණු 55)

(b) (i) දී ඇති ලැයිස්තුවෙන් සුදුසු ද්‍රාවණය තෝරාගෙන කොටුව තුළ ලිවීමෙන් පහත දී ඇති ප්‍රතික්‍රියා සම්පූර්ණ කරන්න. ද්‍රාවණ ලැයිස්තුව දී ඇත්තේ පිළිවෙලින් නොවේ.

$Na_2SO_4$, $Pb(NO_3)_2$, $(NH_4)_2CO_3$, $K_2S_2O_3$, $BaCl_2$, NaI

සැ.යු. : එක් ද්‍රාවණයක් එක් වරක් පමණක් භාවිතා කළ යුතුය.

(I) $BaCl_2(aq)$ + [ ] → A (තනුක HCl හි ද්‍රාවණය නොවන සුදු පැහැ අවක්ෂේපයක්)

(II) NaBr (aq) + [ ] → B (උණු ජලයේ ද්‍රාවණය වන ලා කහ පැහැ අවක්ෂේපයක්)

(III) $Pb(NO_3)_2(aq)$ + [ ] → C (රත් කිරීමේදී කළු පැහැ වන සුදු අවක්ෂේපයක්)

(IV) $(NH_4)_2 SO_3(aq)$ [ ] + → D (තනුක HCl හි ද්‍රාවණය වන සුදු පැහැ අවක්ෂේපයක්)

(V) $AgNO_3(aq)$ + [ ] → E (තනුක හෝ සාන්ද්‍ර ඇමෝනියා හි ද්‍රාවණය නොවන කහ පැහැ අවක්ෂේපයක්)

(VI) $CaCl_2(aq)$ + [ ] → F (තනුක HCl හි ද්‍රාවණය වී පැහැදිලි ද්‍රාවණයක් ලබාදෙන සුදු පැහැ අවක්ෂේපයක්)

(ii) A සිට F දක්වා ඇති අවක්ෂේප වල රසායනික සූත්‍ර ලියන්න.

A - .................................... D - ....................................

B - .................................... E - ....................................

C - .................................... F - ....................................

(iii) ඉහත (b.i) හි ඇතිවන D හා F අවක්ෂේප ද්‍රවණය වීමට අදාල තුලිත රසායනික සමීකරණ ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

(iv) C අවක්ෂේපය රත් කිරීමේදී සිදුවන ක්‍රියාවලිය සඳහා තුලිත රසායනික ප්‍රතික්‍රියාව ලියන්න.

.............................................................................................................................

(2b. ලකුණු 45)

(03) (a) (i) ප්‍රොපේන් $(CH_3CH_2CH_3)(g)$ වල සම්මත දහන එන්තැල්පිය අර්ථ දක්වන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(ii) ප්‍රොපේන් වල සම්මත දහන එන්තැල්පිය නිර්ණය සඳහා කරන ලද පරීක්ෂණයක තොරතුරු පහත පරිදි වේ.

ස්කන්ධය මනින ලද ප්‍රොපේන් සිලින්ඩරයක් දාහකයකට සම්බන්ධ කර ජලය 400 $cm^3$ අඩංගු බීකරයක් එම දාහකයෙන් රත් කරන ලදී. ජලයේ උපරිම උෂ්ණත්වය 85 $^0C$ වන අවස්ථාවේ දාහකය ක්‍රියා විරහිත කර ප්‍රොපේන් සිලින්ඩරයේ ස්කන්ධය නැවත මිනුම් කරන ලදී.

- සිලින්ඩරයේ ආරම්භක ස්කන්ධය = 1500 g
- සිලින්ඩරයේ අවසන් ස්කන්ධය = 1497.8 g
- කාමර උෂ්ණත්වය = 27 $^0C$
- ජලයේ ඝණත්වය 1 g $cm^{-3}$ ජලයේ වි.තා.ධා. 4.2 J $g^{-1}$ $C^{-1}$

ඉහත දත්ත යොදා ගෙන දහනයේදී පිටවන තාප ප්‍රමාණය ගණනය කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(iii) ප්‍රොපේන් වල සම්මත දහන එන්තැල්පිය ගණනය කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(iv) ප්‍රොපේන් වල සම්මත දහන එන්තැල්පියේ සෛද්ධාන්තික අගය -2220 kJ $mol^{-1}$ වේ. නම් ඉහත ඔබ ලබාගත් අගය හා මෙම අගය අතර වෙනසට හේතු දෙකක් ලියන්න.

.....................................................................................................................

.....................................................................................................................

(b) A සහ B ප්ලාස්කු දෙක පරිමාව නොගිනිය හැකි නලයකින් සම්බන්ධ කර ඇත. A ප්ලාස්කුවේ පරිමාව B හි පරිමාව මෙන් දෙගුණයකි. ආරම්භයේ දී කරාමය වසා ඇති අතර A ප්ලාස්කුව තුළ He මවුල 0.6 ක් හා B හි $H_2$ මවුල 0.3 ක් පවතී. A ප්ලාස්කුව තුළ පීඩනය $5 \times 10^4$ Pa හා උෂ්ණත්වය 300 K වන අතර B හි උෂ්ණත්වයද 300 K වේ. ඉන්පසු කරාමය විවෘත කර A හා B ප්ලාස්කු වල උෂ්ණත්වය 400 K දක්වා වැඩිකරන ලදී.

(i) ආරම්භයේ දී B ප්ලාස්කුවේ පීඩනය ගණනය කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ii) A සහ B ප්ලාස්කුවල පරිමාව ගණනය කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(iii) කරාමය විවෘත කර උෂ්ණත්වය ඉහළ නැංවූ පසු එක් එක් වායුවේ ආංශික පීඩන ගණනය කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(iv) සම්බන්ධිත භාජනවල මුළු පීඩනය ගණනය කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(v) ඔබ ගණනයේ දී සිදුකරන ලද උපකල්පනයක් සඳහන් කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

(c) $CO(g) + \frac{1}{2}O_2(g) \rightarrow CO_2(g)$

යන ප්‍රතික්‍රියාව 300 K දී තාපදායක හා ස්වයංසිද්ධව සිදුවන බව පෙන්වන්න.

ප්‍රතික්‍රියාවේ සම්මත එන්ට්‍රොපි විපර්යාසය $-0.094\ kJ\ mol^{-1}\ K^{-1}$ සහ $CO_2(g)$, $O_2(g)$ සහ $CO(g)$ වල සම්මත ගිබ්ස් ශක්ති අගයන් පිළිවෙලින් $-394.4\ kJ\ mol^{-1}$, $0\ kJ\ mol^{-1}$ සහ $137.2\ kJ\ mol^{-1}$.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(04) (a) P, Q සහ R යනු අණුක සූත්‍රය $C_6H_{12}$ වන සමාවයවික හයිඩ්‍රොකාබන තුනකි. P සංයෝගය පාරත්‍රිමාණ සමාවයවිකතාවය දක්වන අතර Q සහ R සංයෝග එය නොදක්වයි. R ප්‍රතිරූප අවයව සමාවයවිකතාවය දක්වයි. Q සමාවයවිකය තුල $sp^2$ මුහුම්කරණය වූ කාබන් පරමාණුවලට සෘජුවම බැඳුනු හයිඩ්‍රජන් පරමාණු එකක් පමණක් පවතී. P, Q හා R සංයෝග HBr සමඟ ප්‍රතික්‍රියා කළ විට පිළිවෙලින් S, T සහ U සංයෝග ලබාදෙයි. S, T සහ U සංයෝග $C_2H_5OH$ / KOH සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන් පසු උත්ප්‍රේරිත හයිඩ්‍රජනීකරණය කළ විට, S හා T යන සංයෝග V ද U සංයෝගය W ද සාදයි. V සහ W යනු ස්ථාන සමාවයවික දෙකකි. P, Q, R, S, T, U, V සහ W හි ව්‍යුහ දක්වන්න.

P Q R

S T U

V W

(b) (i) පහත දී ඇති ප්‍රතික්‍රියා වලදී ලැබෙන A, B, C, D සහ E ප්‍රධාන ඵලයන් ඒවා සමඟ දී ඇති කොටු තුළ දක්වන්න.

(I) $CH_3 - C \equiv C - CH_3 \xrightarrow[\text{ක්විනොලීන්}]{H_2 / Pd - BaSO_4}$ A

(II) 

$\xrightarrow[\text{සාන්ද්‍ර } H_2SO_4,\ \Delta]{\text{සාන්ද්‍ර } HNO_3}$ B

(III) $CH_3\,CH_2\,CH = CH_2 \xrightarrow{HBr}$ C

(IV) $CH_3\,C \equiv C\,H \xrightarrow[\Delta]{Hg^{2+} \text{/තනුක } H_2SO_4}$ D

(V)  $\xrightarrow[\text{නිර්ජල } AlCl_3]{CH_3CH(Br)CH_3}$ E

(ii) (I) ඉහත (i) I සහ IV ප්‍රතික්‍රියාවල ආරම්භක කාබනික සංයෝග එකිනෙකින් වෙන්කර හඳුනාගැනීම සඳහා එක් රසායනික පරීක්ෂාවක් දෙන්න.

.............................................................................................................................

.............................................................................................................................

(II) ඉහත දී ඇති I - V දක්වා ප්‍රතික්‍රියා සඳහා ප්‍රතික්‍රියා වර්ගය $A_N$ , $A_E$ , $S_N$ , $S_E$ , E සහ O ලෙස අදාල කොටු තුළ ලියන්න.

| | |
|---|---|
| නියුක්ලියෝෆිලික ආකලන | ($A_N$) |
| ඉලෙක්ට්‍රෝෆිලික ආකලන | ($A_E$) |
| නියුක්ලියෝෆිලික ආදේශ | ($S_N$) |
| ඉලෙක්ට්‍රෝෆිලික ආදේශ | ($S_E$) |
| ඉවත් කිරීම | (E) |
| වෙනත් | (O) |

| | |
|---|---|
| I. ප්‍රතික්‍රියාව | |
| II. ප්‍රතික්‍රියාව | |
| III. ප්‍රතික්‍රියාව | |
| IV. ප්‍රතික්‍රියාව | |
| V. ප්‍රතික්‍රියාව | |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## (B කොටස) රචනා

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) (a) (i) තාත්වික වායුවල හැසිරීම විස්තර කෙරෙන වැන්ඩර්වාල්ස් සමීකරණය ලියා එහි පද හඳුන්වන්න.

(ii) පරිපූර්ණ වායු මවුලයක් සඳහා චාලක ශක්තිය $KE = \frac{3}{2}RT$ බව පරිපූර්ණ වායු සමීකරණය හා චාලක අණුක වාදයේ සමීකරණය ඇසුරෙන් පෙන්වන්න.

(iii) දෘඪ වීදුරු බඳුනක $27\ ^{0}C$ ක උෂ්ණත්වයේ හා $3 \times 10^{5}$ Pa පීඩනයක් යටතේ $N_2$ වායු මවුල 0.3 ක් $N_2O_3$ වායු මවුල් 0.4 ක් හා He වායු මවුල 0.2 ක් අඩංගුව ඇත. පද්ධතිය $327\ ^{0}C$ ක උෂ්ණත්වයට රත් කර $N_2O_3$ වායුව එහි සංඝටක මූලද්‍රව්‍ය බවට සම්පූර්ණයෙන්ම තාප වියෝජනය කරන ලදී. එහිදී ලැබෙන වායුමය පද්ධතිය $327\ ^{0}C$ උෂ්ණත්වයේම පවත්වා ගනිමින් එය සමඟ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කිරීමට තරම් ප්‍රමාණවත් Mg කුඩු සාම්පලයක් ඊට එකතු කරන ලදී. ප්‍රතික්‍රියාවෙන් පසු ලැබෙන ඝන ඵලයට ජලය එකතු කර එම පද්ධතිය නැවත $27\ ^{0}C$ දක්වා සිසිල් කරන ලදී. $27\ ^{0}C$ දී එහි වූ කිසිදු වායුවක් ජලයේ ද්‍රාවණය නොවන බව හා වායු පරිමාවට සාපේක්ෂව ද්‍රව හා ඝන වල පරිමා නොගිනිය හැකි බව ද උපකල්පනය කරන්න.

(I) ඉහත ක්‍රියාපිළිවෙලෙහි ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(II) ඉහත සම්පූර්ණ ප්‍රතික්‍රියාවට අවශ්‍ය වූ Mg ස්කන්ධය ගණනය කරන්න. (Mg = 24)

(III) $27\ ^{0}C$ උෂ්ණත්වයේ වූ පද්ධතියේ පීඩනය ගණනය කරන්න.

(5a. ලකුණු 75)

(b) පරිපූර්ණ ලෙස හැසිරෙන X(g) හා Y(g) අඩංගු පිළිවෙලින් A හා B ලෙස නම් කල බල්බ 2 ක් පිළිබඳව ආරම්භක අවස්ථාවේ තොරතුරු පහත දක්වේ.




බල්බ දෙක පරිමාව නොගිනිය හැකි තරම් වන සිහින් නලයකින් එකිනෙක සම්බන්ධ කර කරාමය වසා ඇත.

(i) ආරම්භක X හා Y වායු මවුල සංඛ්‍යා ගණනය කරන්න.

(ii) කරාමය විවෘත කළ පසු පද්ධතියේ මුළු පීඩනය ගණනය කරන්න.

(iii) කරාමය විවෘත කළ පසු Y(g) හි ආංශික පීඩනය ගණනය කරන්න.

(iv) කරාමය විවෘත කළ පසු X(g) හි මවුල භාගය ගණනය කරන්න.

(v) පසුව බල්බ වල උෂ්ණත්වය $227\ ^{0}C$ දක්වා ඉහළ නැංවූ විට පහත ප්‍රතික්‍රියාව සිදුවන්නේ යැයි උපකල්පනය කරන්න.

$$2X(g) + Y(g) \rightarrow R(g) + Q(g)$$

(I) අවසන් පද්ධතියේ මුළු වායු මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

(II) A තුළ මුළු වායු මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

(III) A තුළ පීඩනය ගණනය ගණනය කරන්න.

(5b. ලකුණු 75)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(06) (a) පහත සඳහන් සම්මත එන්තැල්පි විපර්යාස අර්ථ දක්වා ඒවාට අදාල තුලිත සමීකරණයක් සඳහා උදාහරණයක් බැගින් දෙන්න.

(i) සම්මත ඌර්ධවපාතන එන්තැල්පි විපර්යාසය.

(ii) සම්මත පරමාණුකරණ එන්තැල්පි විපර්යාසය.

(iii) සම්මත ප්‍රථම ඉලෙක්ට්‍රෝනය ලබාගැනීමේ එන්තැල්පි විපර්යාසය.

(6a. ලකුණු 30)

(b) පහත දැක්වෙන ප්‍රතික්‍රියා සලකන්න. දත්ත සපයා ඇත්තේ සම්මත අවස්ථාව සඳහා නොවේ.

| | $\Delta H$ ($kJ\,mol^{-1}$) | $\Delta S$ ($J\,K^{-1}\,mol^{-1}$) |
|---|---|---|
| $2Fe(s) + \frac{3}{2}\ O_2(g) \rightarrow\ Fe_2O_3(s)$ | -824 | -274 |
| $C(s)\ \ +\ \frac{1}{2}\ O_2(g)\ \rightarrow CO(g)$ | -110 | 10 |

(i) $Fe_2O_3(s) + 3\,C(s) \rightarrow 2\,Fe(s) + 3CO(g)$ යන ප්‍රතික්‍රියාව සඳහා $\Delta H$ හා $\Delta S$ ගණනය කරන්න.

$\Delta S$ හි ලකුණ සිදුවන ප්‍රතික්‍රියාව හා එකඟ වේදැයි හේතු සහිතව සඳහන් කරන්න.

(ii) ඉහත b. i. කොටසට අදාල ප්‍රතික්‍රියාව $27^0C$ දී ස්වයංසිද්ධවේ දැයි සුදුසු ගණනය කිරීමක් භාවිතයෙන් පුරෝකථනය කරන්න.

(6b. ලකුණු 45)

(c) සපයා ඇති තාපරසායනික දත්ත භාවිතයෙන් $MgBr_2$ ඝනයේ සම්මත දැලිස් විඝටන එන්තැල්පි විපර්යාසය බෝන් හේබර් චක්‍රයක් භාවිතයෙන් ගණනය කරන්න.

$MgBr_2(s)$ සම්මත උත්පාදන එන්තැල්පිය = $-524\ kJ\,mol^{-1}$

$Mg(g)$ පළමු හා දෙවන අයනීකරණ එන්තැල්පිය පිළිවෙලින් = $738\ kJ\,mol^{-1}$ හා $1451\ kJ\,mol^{-1}$

$Mg(s)$ සම්මත ඌර්ධවපාතන එන්තැල්පිය = $146\ kJ\,mol^{-1}$

$Br_2(l)$ සම්මත වාෂ්පීකරණ එන්තැල්පිය = $31\ kJ\,mol^{-1}$

$Br_2(g)$ සම්මත බන්ධන විඝටන එන්තැල්පිය = $193\ kJ\,mol^{-1}$

$Br(g)$ හි සම්මත ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ එන්තැල්පිය = $-325\ kJ\,mol^{-1}$

(6c. ලකුණු 75)

(07) (a) 3d ආන්තරික මූලද්‍රව්‍යයක් වන M හි ඉහළම ඔක්සිකරණ අංකය, M අයත් කාණ්ඩයේ අංකයට සමාන වේ. M සාදන $M^{2+}$ අයනය ජලය සමග P නම් ජලීය සංකීර්ණය සාදයි. ($P = [M(H_2O_6)]^{2+}$) එය පහත ප්‍රතික්‍රියාවලට භාජනය කරන ලදී.

* සාන්ද්‍ර HCl සමඟ කහ පැහැති Q සංකීර්ණය සාදයි.
* NaOH සමඟ R ඝන සංයෝගය සාදයි.
* වැඩිපුර ඇමෝනියා හමුවේ ද R ඝන සංයෝගය සාදයි.

M හි ඉහළම ඔක්සිකරණ අංකයෙන් ව්‍යුත්පන්න වන ප්‍රබල ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරන ඔක්සි ඇනායනය T වේ.

T තනුක $H_2SO_4$ මගින් යන්තමින් ආම්ලික කර සාන්ද්‍ර KOH ද්‍රාවණයක් එක් කළ විට U සාදයි.

U, පළමු හා දෙවන ආවර්තයේ මූලද්‍රව්‍ය දෙකකින් සැදුණු සහ සංයුජ සංයෝගයක් වන X සමඟ භාස්මික මාධ්‍යයේ දී ප්‍රතික්‍රියා කරවූ විට S ඝන සංයෝගය සෑදේ.

(i) M ලෝහය හඳුනා ගන්න.

(ii) $M^{2+}$ අයනයේ ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය ලියන්න.

(iii) P, R, S, T, U රසායනික සූත්‍ර හා වර්ණ ලියන්න.

(iv) X හඳුනාගන්න.

(v) P හා Q හි IUPAC නාමයන් ලියන්න.

(vi) පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත අයනික සමීකරණය ලියන්න.

T + සා. KOH $\longrightarrow$

U + X $\xrightarrow{\text{භාස්මික}}$

(b) X නැමැති ඝනයේ $FeSO_3$ හා $CuSO_3$ හා නිෂ්ක්‍රීය ද්‍රව්‍යයක් අන්තර්ගත වේ. X වල $FeSO_3$ හා $CuSO_3$ ස්කන්ධ ප්‍රතිශත නිර්ණය කිරීමට පහත ක්‍රියා පිළිවෙල යොදා ගන්නා ලදී.

ක්‍රියා පිළිවෙල,

X ඝනයේ 5g කොටසක් තනුක $H_2SO_4$ ආම්ලික ජලීය මාධ්‍යයක දියකර 0.1 mol $dm^{-3}$ $KMnO_4$ 200 $cm^3$ මගින් පිරියම් කරන ලදී. මෙම ප්‍රතික්‍රියාවේදී ප්‍රතිඵල ලෙස $Fe^{3+}$, $Mn^{2+}$, $SO_4^{2-}$ හා $Cu^{2+}$ ඵල ලෙස ලබා දුනි. වැඩිපුර ඇති $KMnO_4$ 0.3 mol $dm^{-3}$ $Fe^{2+}$ ද්‍රාවණයක් මගින් අනුමාපනය කරන ලදී. අනුමාපනයේ දී වැය වූ $Fe^{2+}$ පරිමාව 100 $cm^3$ විය. ආම්ලික මාධ්‍යයේ දී $SO_3^{2-}$ අයනය, $SO_2(g)$ බවට පත්වීමෙන් වන බලපෑම නොසලකා හරින්න.

(Fe = 56, S = 32, O = 16, Cu = 63.5)

(i) $FeSO_3$ හා $KMnO_4$ අතර,

(ii) $CuSO_3$ හා $KMnO_4$ අතර,

(iii) $FeSO_3$ හා $CuSO_3$ හා ස්කන්ධ ප්‍රතිශත ගණනය කරන්න.

---

## C කොටස - රචනා

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

---

(08) (a) (i) $CH_3C \equiv CH$ භාවිතා කරමින් පහත දැක්වෙන ප්‍රතික්‍රියා අනුක්‍රමයට අනුව Q සංයෝගය පිළියෙල කර ඇත.



A, B, C, D හා E සංයෝග සහ 1 සිට 5 දක්වා පියවර වලට අදාල ප්‍රතිකාරක හඳුනාගන්න. ප්‍රතිකාරක වශයෙන් පහත දී ඇති රසායනික ද්‍රව්‍ය පමණක් තනිව හෝ සංයෝජන ලෙස භාවිතා කළ යුතුය.

| |
|---|
| රසායනික ද්‍රව්‍යය :- |
| තනුක $H_2SO_4$ , $H_2$ , HBr , $NaNH_2$ , Pd - $BaSO_4$ / ක්විනොලින් |

(ii) පහත දැක්වෙන ප්‍රතික්‍රියා දාම සලකන්න. L හා M සංයෝග වල ව්‍යුහ අඳින්න. G,H,I,J සහ K ප්‍රතිකාරක දෙන්න.

(I)




(II)




(b) (i) පහත දැක්වෙන පරිවර්තනය පියවර තුනකට නොවැඩි සංඛ්‍යාවකින් සිදුකරන්නේ කෙසේ දැයි පෙන්වන්න.

$$CH_3CH_2CH_2CH_2Br \xrightarrow{\quad I \quad} C_2H_5\text{-}\underset{\displaystyle OH}{\underset{|}{CH}}\text{-}CH_3$$

(ii) පහත ප්‍රතික්‍රියාව සලකන්න.




(I) මෙම ප්‍රතික්‍රියාව සිදුකිරීම සඳහා අවශ්‍ය වන $x$ සහ $y$ රසායන ද්‍රව්‍යයන් හඳුනාගන්න.

(II) මෙම ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය ලියන්න.

(09) (a) P, Q, R, S, T, U ලෙස ලේබල් කළ $AgNO_3$, $Al(NO_3)_3$, $Pb(NO_3)_2$, $BaCl_2$, $ZnCl_2$, $CaCO_3$ (පිළිවෙලින් නොවේ) ඝන ද්‍රව්‍ය හයක් සපයා ඇත. එම සංයෝග පහත පරීක්ෂණ වලට භාජනය කළ විට ලැබුණු නිරීක්ෂණය පහත වගුවේ දැක්වේ.

| | පරීක්ෂණ | නිරීක්ෂණ |
|---|---|---|
| (1) | සංයෝග වෙන වෙනම ජලයේ දිය කරන ලදී. | P සංයෝගය පමණක් ජලයේ දිය නොවීය. |
| (2) | Q, R, S, T, U මගින් ලද ද්‍රාවණ වලට $Na_2S_2O_3$ ද්‍රාවණය එක් කරන ලදී. | Q, R ද්‍රාවණ වල සුදු අවක්ෂේප ඇති විය. Q මගින් ලැබෙන අවක්ෂේපය ටික වේලාවකින් කළු පැහැයට හැරුණි. |
| (3) | S, T, U ද්‍රාවණ වලට තනුක $H_2SO_4$ එක් කරන ලදී. | S මගින් තනුක $HNO_3$ තුළ අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් ලැබුණි. |
| (4) | T, U ද්‍රාවණ වලට NaOH බින්දුව බැගින් එක් කරන ලදී. | T හා U මගින් සුදු ජෙලටිනීය අවක්ෂේපය ලැබුණි. |
| (5) | ඉහත 4 දී ලැබුණු සුදු අවක්ෂේප වලට ජලීය $NH_3$ (වැඩිපුර) එක් කරන ලදී. | T මගින් ලැබුණු අවක්ෂේපය පමණක් සම්පූර්ණයෙන් දිය විය. |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(i) P, Q, R, S, T, U වෙන්කර හඳුනා ගන්න.

(ii) R, $Na_2S_2O_3$ හමුවේ ලැබෙන අවක්ෂේපය රත් කළ විටදී ලැබෙන ඵල සඳහන් කරන්න.

(iii) U, NaOH සමඟ සිදුකරන පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

$U + NaOH \rightarrow$ සුදු අවක්ෂේපය

$U +$ වැඩිපුර $NaOH \rightarrow$ අවර්ණ ද්‍රාවණය

(iv) T, NaOH සමග ලැබෙන අවක්ෂේපය ජලීය $NH_3$ තුළ දියවීමට අදාල තුලිත ප්‍රතික්‍රියාව ලියන්න.

(b) ප්‍රාථමික සම්මත ද්‍රව්‍යයක් වන ඝන $K_2Cr_2O_7$ 4.704 g ක් 500 $cm^3$ ජලය සම්පූර්ණයෙන් දියකරන ලදී. මෙම ද්‍රාවණයෙන් 25 $cm^3$ ක් වෙන් කර තනුක $H_2SO_4$ මගින් ආම්ලික කර වැඩිපුර KI එක් කරන ලදී. මෙම ද්‍රාවණය සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීම සඳහා $Na_2S_2O_3$ 24 $cm^3$ පරිමාවක් අවශ්‍ය විය.

(i) ප්‍රාථමික සම්මත ද්‍රව්‍යයක ලක්ෂණ 02 ක් ලියන්න.

(ii) ඉහත ක්‍රියාවලියේ දී සිදු වන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

(iii) $Na_2S_2O_3$ සාන්ද්‍රණය ගණනය කරන්න. (K = 39, Cr = 52, O = 16)

(10) (a) A හා B අෂ්ටතලීය ජ්‍යාමිතියක් ඇති සංකීර්ණ අයන අඩංගු සංගත සංයෝග දෙකකි. ඒවායේ අඩංගු පොදු පරමාණුක සංයුතිය $CoN_5H_{12}Cl_2O_2$ වේ. එක් එක් සංයෝගයේ හයිඩ්‍රජන් පරමාණු සියල්ල පවතිනුයේ $NH_3$ ලෙස පමණි. A සංයෝගය ජලීය $AgNO_3$ සමඟ සුදු අවක්ෂේපයක් ලබා නොදෙන අතර B සංයෝගය ජලීය $AgNO_3$ සමඟ තනුක $NH_3$ වල ද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් ලබාදේ.

(i) A සහ B වල ව්‍යුහ සූත්‍ර ලියන්න.

(ii) A සහ B හි Co වල ඔක්සිකරණ අංකය ලියන්න.

(iii) සංකීර්ණ අයනයේ Co හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

(iv) A හි අඩංගු $NH_3$ සියල්ල $H_2NCH_2CH_2NH_2$ සමඟ දහනය මඟින් ප්‍රතිස්ථාපනය කරයි. එවිට M වටා අණුක ජ්‍යාමිතිය වෙනස් නොවේ. ලැබෙන නව සංකීර්ණ අයනයේ ව්‍යුහය අඳින්න.

(b) එක්තරා අප ජල සාම්පලයක $FeSO_3$ සහ $FeSO_4$ මිශ්‍රණයක් අඩංගු වේ. එහි ඇති $FeSO_3$ හා $FeSO_4$ සාන්ද්‍රණ නිර්ණය කිරීම සඳහා පහත ක්‍රමවේද ඉදිරිපත් කරන ලදී.

<u>ක්‍රියා පිළිවෙල 01 :</u>

ජල සාම්පලයෙන් 50 $cm^3$ ක් වැඩිපුර 0.6 mol $dm^{-3}$ $H_2O_2$ ද්‍රාවණ සමඟ මිශ්‍රකර ද්‍රාවණයක් පිළිවෙල කර ඇත. (A)

<u>ක්‍රියා පිළිවෙල 02 :</u>

A ද්‍රාවණයෙන් 50 $cm^3$ ක නියැදියක් සමඟ සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට ආම්ලික 0.04 mol $dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණ 25 $cm^3$ ක් වැය විය.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ක්‍රියා පිළිවෙල 03 :

ඉහත A ද්‍රාවණයෙන් ලබාගත් තවත් 50 $cm^3$ ක් ආම්ලික කර එයට වැඩිපුර $Ba(NO_3)_2$ ද්‍රාවණයක් එක් කළ විට අවක්ෂේපයක් සෑදුණි. එම අවක්ෂේපය නියත බරක් ලැබෙන තුරු හොඳින් වියලා ගත් විට බර 4.66 g ක් විය.

(i) ඉහත ක්‍රියා පිළිවෙල 01, 02, 03 සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(ii) සාම්පලයේ $FeSO_3$ සහ $FeSO_4$ සාන්ද්‍රණ ගණනය කරන්න. (Fe = 56, S = 32, Ba = 137, O = 16)

(c) පහත දැක්වෙන සම්මත බන්ධන විඝටන එන්තැල්පි යොදාගෙන HF(g) හි සම්මත උත්පාදන එන්තැල්පිය ගණනය කරන්න.

| බන්ධනය | සම්මත බන්ධන විඝටන එන්තැල්පිය / $kJ\ mol^{-1}$ |
|---|---|
| H - H | + 432 |
| F - F | + 158 |
| H - F | + 569 |



## The Periodic Table / ආවර්තිතා වගුව

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Ds | 111 Rg | 112 Cn | 113 Nh | 114 Fl | 115 Mc | 116 Lv | 117 Ts | 118 Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources